// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 2079/14 - 2018 ජූලි මස 09 වැනි සඳුදා - 2018.07.09
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### හම්බන්තොට ප්‍රාදේශීය සභාව

විනෝද බද්ද

(267 වන අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය සභාව විසින් 2015.07.24 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 6.1 යටතේ සම්මත කරන ලද පහත දක්වෙන යෝජනාව, 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු විනෝද බදු ආඥාපනතේ 2 වගන්තියේ (2) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍ය ගුස්තිඤ්ඤා වඩු ශාන් විජයලාල් ද සිල්වා වන ම විසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගුස්තිඤ්ඤා වඩු ශාන් විජයලාල් ද සිල්වා,
දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය,
මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉංජිනේරු සේවා,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පළාත් පාලන, ප්‍රවාහන හා සංචාරක අමාත්‍ය.

2018 මැයි මස 20 වැනි දින,
ගාල්ල,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**යෝජනාව**

267 වන අධිකාරය වන විනෝද බදු ආඥාපනතේ කාර්යය සඳහා වන කිසියම් විනෝද කටයුත්තක් හම්බන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිදු කරන සෑම තැනැත්තෙකු විසින්ම එම විනෝද කටයුත්ත,

(අ) ඕනෑම විනෝද කාර්යයක් වන විට ඒ සඳහා ඇතුළත් කර ගන්නා තැනැත්තන්ගෙන් අයකර ගන්නා මුදල් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ප්‍රමාණයට සමාන මුදලක්,

ඉහත කී විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ පළාත් පාලන ආයතන වලට ලැබී ඇති බලතල ප්‍රකාර විනෝද බද්ද වශයෙන් පනවා අයකර ගත යුතු බවත්, එකී විනෝද කාර්යය පවත්වන දිනට පෙර එකී විනෝද බද්ද හම්බන්තොට ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් හම්බන්තොට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

07-771

1A - PG 4108— 10 (2018/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*